පාර්ලිමේන්තුවේ පුස්තකාලය
0 5 AUG 1994
ශ්‍රී ජයවර්ධනපුර

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 5 දරන
# ජාතික වැවිලි කළමනාකරණ
# ආයතන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 ජනවාරි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 ජනවාරි මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1987 අංක 5 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ජනවාරි මස 30 වන දින.]

එල්. ඩී. ඕ. 18/83.

## 1979 අංක 45 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :— පුඵඵ නාමය.

1. මේ පනත 1987 අංක 5 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 45 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිවම ඇති "විය යුතුය" යන පද ඉවත් කර පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(උ) වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය දක්ෂතාවය ඇති තැනැත්තන්ට වැවිලි කර්මාන්තයේ මිනිස්බල අවශ්‍යතාවයන් ගැන සැලකිලිමත්ව, වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් පුහුණුව ලබාදීම ;

(ඌ) වැවිලි කර්මාන්තය සම්බන්ධයෙන් යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, රාජ්‍ය සංස්ථාවකට හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර යම් වෙනත් ආයතනයකට කළමනාකාරිත්ව, තාක්ෂණික සහ පරිපාලන උපදෙස් සහ සේවා සැපයීම

විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (එ) ඡේදයට ඉක්බිතිව ඇති "සඳහා" යන පදයෙන් පටන් ගෙන "යුතුය" යන පදයෙන් අවසන් වන සියළුම පද ඉවත් කොට පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(ඒ) විවිධ සාමාජිකත්ව ශ්‍රේණිවලට ඇතුළත් කර ගැනීම සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් තක්සේරු කිරීම සහ ආයතනයේ සියළු සාමාජිකත්ව ශ්‍රේණි සඳහා යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම හෝ පැවැත්වීම සඳහා විධිවිධාන සැලසීම සහ ඒ විභාගය සඳහා අධ්‍යයන පාඨමාලා ප්‍රවර්ධනය කිරීම, සැපයීම හෝ අනුමත කිරීම ;

(ඔ) ආයතනයේ සාමාජිකයන්ගේ වෘත්තීය කටයුතු සහ සාමාන්‍ය පැවැත්ම උසස් තත්ත්වයක පවතින බවට වග බලා ගැනීම හා එම තත්ත්වය ආරක්ෂා කිරීම

සඳහා යුක්ති සහගත ලෙස අවශ්‍ය වන්නා වූ බලතල, අයිතිවාසිකම් සහ කර්තව්‍ය ආයතනයට තිබිය යුතු ය".

2—ඒ 092369—7,250 (86/09)

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) උප වගන්තියේ (ඇ) ඡේදයේ (i) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

"(i) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු ;".

අලුත් කොටසක් ප්‍රධාන ප්‍රඥප්තියට අන්තර්ගත කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස අන්තර්ගත කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 1අ. කොටස ලෙස බල පැවැත්විය යුතු ය :—

"1 අ කොටස

සාමාජිකත්වයට ඇතුළු කර ගැනීමේ සුදුසුකම්, සාමාජිකත්වයෙන් ඉවත් කිරීම පිළිබඳ විධිවිධාන, අභිධාන භාවිතා කිරීම ආදිය.

සාමාන්‍ය නුසුදුසුකම්

15අ. (1) පහත දැක්වෙන නුසුදුසුකම් සහිත නම් කිසිම තැනැත්තෙකු 4 වන වගන්තිය යටතේ ආයතනයේ සාමාජිකයකු ලෙස ඇතුළත් කර නොගත යුතු ය :—

(අ) වයස අවුරුදු දහ අට පිරී නොතිබීම ;

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් සිහි විකල තැනැත්තකු බවට විනිශ්චය කරනු ලැබ සිටීම ;

(ඇ) වස්තු භංගත්වයට පත්වූයෙකු හෝ බංකොළොත් වූවෙකු බවට තීරණය කරනු ලැබ, ඔහුගේ වස්තු භංගත්වය හෝ බංකොළොත් භාවය සම්පූර්ණයෙන්ම හෝ තරමක් දුරට නොවැළැක්විය හැකි පාඩු හෝ අභාග්‍යය නිසා සිදු වූ බවට වූ සහතිකයක් නිසි බලය ඇති අධිකරණයක් විසින් ප්‍රදානය කර නොලැබ තිබීම ;

(ඈ) චරිත දූෂණයට අදාළ වූ ද මාස හයකට නොඅඩු කාලයක් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය හැකි වූ ද යම් වරදකට, ශ්‍රී ලංකාවේ හෝ ඉන් බැහැර, යම් කිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ සිටීම ;

(2) ආයතනයේ සාමාජිකයකු වන යම් තැනැත්තකු මේ වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයේ, හෝ (ඇ) ඡේදයේ හෝ (ඈ) ඡේදයේ සඳහන් යම් නුසුදුසුකමකට යටත් වන්නේ නම්, මණ්ඩලය විසින් ඔහු සාමාජිකත්වයෙන් ඉවත් කළ යුතුය :

එසේ වුවද එසේ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම නිසා, පසුව එම තැනැත්තා සාමාජිකයකු වීමට සුදුසු බවට මණ්ඩලය සෑහීමට පත්ව ඒ තැනැත්තා නැවත සාමාජිකයකු වශයෙන් ඇතුළත් කර ගැනීම, නොවැළැක්වෙන්නේ ය.

වෘත්තීය විෂමාචාරය නිසා සාමාජිකත්වයෙන් ඉවත් කිරීම.

15 ආ. (1) ආයතනයේ සාමාජිකයකු වන යම් පුද්ගලයකු වෘත්තීය විෂමාචාරය පිළිබඳව වරදකරු වීමේ හේතුව නිසා, සාමාජිකයකුව සිටීමට නුසුදුසු වී ඇති බවට මණ්ඩලය සෑහීමට පත්වන්නේ නම් මණ්ඩලය විසින් ඒ තැනැත්තා සාමාජිකත්වයෙන් ඉවත් කළ හැකි ය.

(2) (1) වන උප වගන්තිය යටතේ යම් සාමාජිකයකු සාමාජිකත්වයෙන් ඉවත් කිරීම නිසා ඔහු සාමාජිකයකුගේ වෘත්තියෙහි යෙදීමට සුදුසු බවට ඊට පසුව මණ්ඩලය සෑහීමට පත් වන්නේ නම් නැවත සාමාජිකත්වයට ඇතුළු කර ගැනීමෙන් මණ්ඩලය නොවැළැක්වෙන්නේ ය.

(3) මේ පනතේ කාර්ය සඳහා—

(අ) බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවමක් කරනු ලැබිය හැකි වූ ද චරිත දූෂණය සම්බන්ධ වන්නා වූ ද යම් වරදකට ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ;

(ආ) වෘත්තීය කටයුතු ඉටු කිරීමෙහි ලා බරපතල නොසැලකිල්ල ;

(ඇ) අසත්‍ය බව දැන දැනම මණ්ඩලය වෙත අසත්‍ය ප්‍රකාශනයක්, ප්‍රකාශයක් හෝ වාර්තාවක් කිරීම ;

(ඈ) ආයතනයේ හොඳ නමට කැළලක් ඇති කිරීම හෝ ඇති කිරීමට තැත් කිරීම

වෘත්තීය විෂමාචාර වශයෙන් සලකනු ලැබිය යුතු ය.

විනය කමිටු පරීක්ෂණ.

15 ඈ. (1) කිසිම සාමාජිකයකු, ඔහු වෘත්තීය විෂමාචාරය පිළිබඳව වරදකරු වී ඇති බව විනය කමිටුව විසින් පරීක්ෂණයකින් පසුව සභාවට වාර්තා කරනු ලැබ ඇත්නම් මිස, මණ්ඩලය විසින් 15ආ වගන්තිය යටතේ සාමාජිකත්වයෙන් ඉවත් නොකළ යුතු ය.

(2) ආයතනයේ සාමාජිකයකු වෘත්තීය විෂමාචාරය සම්බන්ධයෙන් වරදකරු වී ඇති බව, මණ්ඩලය වෙත කරන ලද පැමිණිල්ලක් අනුව හෝ අන්‍යාකාරයෙන්, විශ්වාස කිරීමට මණ්ඩලයට සෑහෙන හේතු ඇති අවස්ථාවක, එම සාමාජිකයාගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින් විනය කමිටුවක් පත් කළ හැකි ය.

(3) මේ වගන්තිය යටතේ පත් කරන ලද විනය කමිටුවල සංයුතිය, ඒ කමිටු විසින් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, ඒ කමිටු විසින් පවත්වනු ලබන පරීක්ෂණවල කටයුතු සහ ඒ කමිටු විසින් ක්‍රියාත්මක කළ හැකි බලතල සම්බන්ධයෙන් මේ පනතේ උප ලේඛනයේ විධිවිධාන අදාළ විය යුතු ය.

සාමාජිකත්වයෙන් ඉවත් කිරීම වෙනුවට සාමාජිකත්ව අත්හිටුවීම.

15 ඈ. යම් සාමාජිකයකු ආයතනයේ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට 15ආ වගන්තිය යටතේ මණ්ඩලයට බලය ලැබී ඇති යම් අවස්ථාවක දී, මණ්ඩලය විසින් එම බලය ක්‍රියාත්මක කිරීම වෙනුවට, මණ්ඩලය විසින් සුදුසු යයි අදහස් කරනු ලබන යම් කාලසීමාවකට එම සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටුවිය හැකි ය.

15 ආ හෝ 15 ඈ වගන්ති යටතේ වූ මණ්ඩලයේ තීරණවලට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනා කිරීම.

15 ඉ. 15 ආ වගන්තිය හෝ 15 ඈ වගන්තිය යටතේ මණ්ඩලය විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ තීරණයට විරුද්ධව වූ අභියාචනයක් ; එම තීරණය ඔහුට දැනුම් දෙනු ලැබූ දින සිට එක් මාසයක් ඇතුළත, අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි ය.

මේ පනත යටතේ ප්‍රදානය කරන ලද අභිධානය භාවිතය සීමා කිරීම.

15ඊ. ආයතනය විසින්—

" ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ ශිෂ්‍ය සාමාජික "

" ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ ආශ්‍රිය සාමාජික "

" ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අධි සාමාජික "

ලෙස ඇතුළත් කර ගනු ලැබ ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් එම අභිධානය ලබා ගැනීම හෝ භාවිතා කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

වැරදි.

15උ. මේ පනතේ 15ඊ වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම අතපසු කරන්නා වූ හෝ පැහැර හරින්නා වූ හෝ සෑම තැනැත්තකුම, වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු විභාගයෙන් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට, හය මාසයක් නොඉක්මවන කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:—

" රීති සාදනු ලැබීමට ඇති බලය.

(1) රීති සාදනු ලැබීමට මේ පනතින් බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලුම කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් ආයතනය විසින් රීති සෑදිය හැකි ය ;

(2) (1) වන උප වගන්තියේ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, මණ්ඩලය විසින් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යමක් සම්බන්ධයෙන් රීති සෑදිය හැකි ය :—

(අ) සියලු සාමාජික ශ්‍රේණිවලට ඇතුළත් වීමේ සුදුසුකම් ;

(ආ) විවිධ සාමාජිකත්ව ශ්‍රේණිවලට ඇතුළත් වීමේ ගාස්තු සහ සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු ගෙවිය යුත්තේ කුමන කාලයක් ඇතුළත, කුමන ආකාරයකින් ද යන්න සහ අලුත් කිරීමේ ගාස්තුව ගෙවීම පැහැර හරිනු ලැබූ විට සාමාජිකත්වය අවසාන කිරීම සහ එවැනි අවස්ථාවල දී සාමාජිකත්වය නැවත ලබාදීමේ කොන්දේසි ;

(ඇ) යෝග්‍යතා පරීක්ෂණවලට ඇතුළත් කරගනු ලබන ශිෂ්‍යයන් විසින් මණ්ඩලයෙන් සැපයෙන අධ්‍යයන පාඨමාලා සඳහා මණ්ඩලයට ගෙවිය යුතු ගාස්තු සහ කථිකාචාර්යවරුන් සහ පරීක්ෂකවරුන් බඳවා ගැනීම සහ ඔවුන්ගේ පාරිශ්‍රමික ;

(ඇ) ශිෂ්‍ය සාමාජිකයන්ට මුදලින් හෝ අන්‍යාකාරයෙන් ආධාර ප්‍රදානය කිරීම.

(3) මේ වගන්තිය යටතේ ආයතනය විසින් සාදන ලද යම් රීතියක් එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක්, බලාත්මක නොවිය යුතු ය.

## උපලේඛනය

### විනය කමිටු විසින් පවත්වනු ලබන පරීක්ෂණවලට අදාළ රීති

**1.** මේ පනත යටතේ පැවැත්විය යුතු පරීක්ෂණයක කාර්ය සඳහා විනය කමිටුව සංයුක්ත වීම සඳහා මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් තුන්දෙනකු මණ්ඩලය විසින් කුසපත් ඇදීමෙන් නම් කර පත් කළ යුතු අතර එයින් එක්කෙනෙකු කමිටුවේ සභාපති වශයෙන් පත් කළ යුතු ය.

**2.** (1) විනය කමිටුව විසින් විමර්ශනය කළ යුතු චෝදනා දැක්වෙන සේ පිළියෙල කරන ලද ප්‍රකාශයක් මණ්ඩලය විසින් සකස් කරවිය යුතු අතර, මණ්ඩලයේ ලේකම්වරයා විසින් එම ප්‍රකාශයේ පිටපතක් කමිටුවේ එක් එක් සාමාජිකයාට ද ස්වකීය ක්‍රියාකලාපය විමර්ශනයට භාජනව ඇති තැනැත්තාට ද යැවිය යුතු ය.

(2) පරීක්ෂණය, යම් තැනැත්තකුගේ විෂමාචාරය පිළිබඳව චෝදනා කෙරෙන පෙත්සමක් හෝ පැමිණිල්ලක් හේතුකොට ගෙන පවත්වනු ලබන අවස්ථාවක, මණ්ඩලය විසින් ඊට අමතරව, අවස්ථාවෝචිත පරිදි එම පෙත්සමේ හෝ පැමිණිල්ලේ පිටපත් ඒ තැනැත්තාට ද විනය කමිටුවේ එක් එක් සාමාජිකයකුට ද යැවිය යුතු ය.

**3.** (1) පරීක්ෂණය සඳහා නියම කරනු ලැබ ඇති පළමු දිනය පිළිබඳ දැන්වීම, මණ්ඩලයේ ලේකම්වරයා විසින්, ස්වකීය ක්‍රියාකලාපය විමර්ශනයට භාජනව ඇති තැනැත්තාට දිය යුතු ය. එවැනි සෑම දැන්වීමක් ම, විමර්ශනය සඳහා නියමිත දිනයට යටත් පිරිසෙයින් දින දහහතරකටවත් කලින් එම තැනැත්තා අවසාන වරට දැන සිටි පදිංචි ස්ථානයේ දී ඒ තැනැත්තාට පෞද්ගලිකව භාර දිය යුතුය. එසේ නැතහොත් එම ස්ථානයට යොමු කරන ලද ලියාපදිංචි ලිපියක මාර්ගයෙන් තැපෑලෙන් යැවිය යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ දැන්වීමක් දෙනු ලැබූ තැනැත්තකු පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයා මඟින් පෙනී සිටීම පැහැර හැරියහොත් විනය කමිටුව විසින් පරීක්ෂණය ඔහු නොමැතිව පැවැත්විය යුතු ය.

(3) පරීක්ෂණය යම් දිනකට කල් තබනු ලැබුවද එම දිනය පිළිබඳ දැන්වීම කමිටුව විසින්, ස්වකීය ක්‍රියාකලාපය විමර්ශනයට භාජනව ඇති තැනැත්තාට පෞද්ගලිකව භාර දිය යුතුය; එසේ නැතහොත් (1) වන ඡේදයේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට දිය යුතු ය.

**4.** (1) යම් කාරණයක් විනය කමිටුවක් විසින් විමර්ශනය කළහැකිවීම සඳහා යම් තැනැත්තකුගේ සාක්ෂි හෝ යම් තැනැත්තකු විසින් යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය බව මණ්ඩලයේ මතය වන අවස්ථාවක, දැන්වීමක නිශ්චිතව සඳහන් කරනු ලබන ස්ථානයක දී සහ වේලාවක දී ඒ තැනැත්තා පැමිණ සිටිය යුතු බව හෝ ඒ තැනැත්තා, විසින් ඒ ලේඛනය ඉදිරිපත් කළ යුතු බව නියම කරන ලෙස මණ්ඩලය විසින් මණ්ඩලයේ ලේකම්වරයාට විධාන කළ යුතු ය. එම දැන්වීම ඒ තැනැත්තාගේ අවසාන වරට දැන සිටි පදිංචි ස්ථානයේ දී ඒ තැනැත්තාට පෞද්ගලිකව භාර දිය යුතු ය : එසේ නැතහොත් එම ස්ථානයට යොමු කරන ලද ලියාපදිංචි ලිපියක මාර්ගයෙන් තැපෑලෙන් යැවිය යුතු ය.

(2) මණ්ඩලයේ තත් කාලයේ ලේකම්වරයා සෑම විනය කමිටුවකම ලේකම්වරයා විය යුතු අතර, මේ රීති යටතේ නිකුත් කරනු ලබන සෑම දැන්වීමක් ම ඔහු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) විනය කමිටුවක් ඉදිරියේ සාක්ෂි දීමට නියමිත සියළුම තැනැත්තන් දිවුරවීමට හෝ ප්‍රතිඥා කරවීමට විනය කමිටුවකට බලය තිබිය යුතු ය.

(4) ස්වකීය ක්‍රියාකලාපය පරීක්ෂණයක දී විමර්ශනයට භාජනව ඇති යම් තැනැත්තකු හෝ එම පරීක්ෂණය ගැන යම් අයුරක සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු ඒ පරීක්ෂණයේ දී නීතිඥවරයකු විසින් නියෝජනය කරනු ලැබිය හැකි ය.

(5) සාක්ෂි ඉදිරිපත් කිරීම හා සාක්ෂි ගැනීම සම්බන්ධයෙන් විනය කමිටුවට උපකාරවීම සඳහා යම් නීතිඥවරයෙකුට මණ්ඩලය විසින් බලය දිය හැකි ය.

(6) මණ්ඩලය විසින් අන්‍යාකාර තීරණයක් කළහොත් මිස, විනය කමිටුවක් විසින් පවත්වනු ලබන සෑම පරීක්ෂණයක්ම අප්‍රසිද්ධියේ පැවැත්විය යුතු ය.

(7) විනය කමිටුව විසින් තීරණය කළ යුතු යම් ප්‍රශ්නයක්, එම කමිටුවේ සාමාජිකයින්ගේ බහුතරයේ තීරණය අනුව තීරණය කරනු ලැබිය යුතු ය.

(8) පරීක්ෂණයක් නිම කළ විට විනය කමිටුව විසින්, එම පරීක්ෂණය පවත්වනු ලැබූයේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණා ගැන කමිටුවේ තීරණ ඇතුළත් වාර්තාවක් සකස් කොට මණ්ඩලයට යැවිය යුතු ය.